ශ්‍රී ලංකා නීති විද්‍යාලය/ இலங்கைச் சட்டக்கல்லூரி / **Sri Lanka Law College**

ශ්‍රී ලංකා නීති විද්‍යාල පොදු ප්‍රවේශ විභාගය - **2022** නොවැම්බර්

(01) භාෂා හැකියාව

පැ තුනයි

විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඔබේ විභාග අංකය තිත් ඉර මත ලියන්න

.....

නිවැරදි බවට නිරීක්ෂකගේ
කෙටි අත්සන

.....

වැදගත්:

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු 09 කින් සහ ප්‍රශ්න **38** කින් යුක්ත වේ.
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
* ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
* දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනි ව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.
* ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත්‍රය ශාලාධිපතිට භාර දිය යුතුය.
* ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පැනෙන් පමණක් ලියන්න. පැන්සල භාවිත නොකරන්න.
* මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායාරූප ගැනීම වරදකි.
* අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය
සඳහා පමණි

පිටුව	ප්‍රශ්න අංකය	ලැබූ ලකුණු
2	1-12	
3	13-24	
4	25-35	
5	36(i,ii,iii)	
6	36 (iv,v)	
7	37	
8-9	38	
එකතුව		

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරින්	

උත්තර පත්‍ර පරීක්ෂක	
ලකුණු පරීක්ෂා කළේ	

- අංක 01 සිට 03 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද අතුරින් එක් පදයක පමණක් අක්ෂර වින්‍යාසය වැරදිය. එම පදය තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

(ලකුණු 03 යි)

1. (1) තාණ්ඩව (2) පුෂ්කරණි (3) නිෂේධනය (4) ආභාෂය (.....)
2. (1) භ්‍රාන්තිය (2) මර්දනය (3) ආමාසය (4) ප්‍රසාරණය (.....)
3. (1) ශික්ෂණය (2) කුන්ඩලිය (3) ප්‍රහර්ෂය (4) මූර්ධන්‍ය (.....)

- අංක 04 සිට 06 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ වචන අකාරාදී පිළිවෙළට සකස් කළ විට නිවැරදි ව දැක්වෙන අනුපිළිවෙළ තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

(ලකුණු 03 යි)

4. (අ) පදාර්ථය (ආ) පක්ෂාඝාත (ඉ) පංචාශ්‍රය (ඊ) පයෝධර
   (1) ආ,අ,ඊ,ඉ (2) අ,ඉ,ආ,ඊ (3) ඉ,ආ,අ,ඊ (4) ආ,ඉ,අ,ඊ (.....)
5. (අ) කුපෝෂණය (ආ) කුණුකසළ (ඉ) කුණාවුව (ඊ) කුරුමිණියා
   (1) ආ,ඉ,අ,ඊ (2) ඉ,ආ,අ,ඊ (3) අ,ආ,ඉ,ඊ (4) අ,ඊ,ඉ,ආ (.....)
6. (අ) මනදොළ (ආ) මණ්ඩලය (ඉ) මකරන්දය (ඊ) මද්‍යසාර
   (1) ඉ,ඊ,අ,ආ (2) අ,ඉ,ආ,ඊ (3) ඊ,අ,ඉ,ආ (4) ඉ,ආ,ඊ,අ (.....)

- අංක 07 සිට 09 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද හතර අතුරින් නිවැරදි ව විසන්ධි කර නොමැති පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

(ලකුණු 03 යි)

7. (1) ආචාර්යෝත්තම - ආචාර්ය + උත්තම (2) අෂ්ටාර්ය - අෂ්ට + ආර්ය
   (3) ව්‍යංගාර්ථ - ව්‍යංග + අර්ථ (4) කාව්‍යාලංකාර - කාව්‍ය + අලංකාර (.....)
8. (1) දිනිසුරු - දිනි + ඉසුරු (2) ප්‍රීතියුත්සවය - ප්‍රීති + උත්සවය
   (3) ක්‍රමෝන්නත - ක්‍රම + උන්නත (4) සමස්තාර්ථය - සමස්ත + අර්ථය (.....)
9. (1) හේතුදාහරණ - හේතු + උදාහරණ (2) පරමෝත්කෘෂ්ට - පරම + උත්කෘෂ්ට
   (3) නයනාරෝග්‍ය - නයනා + ආරෝග්‍ය (4) නීත්‍යනුකූල - නීති + අනුකූල (.....)

- අංක 10 ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

(ලකුණු 01 යි)

10. අකුරු ගළපන ලද කල්හි අර්ථවත් වචනයක් සෑදෙන පිළිතුර කුමක්ද?
    (1) තමාර්යනප (2) බමලසතහ (3) යබම්ලනක (4) ශළදටඩග (.....)

- අංක 11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වාක්‍ය සදොස් වේ නම්, නිදොස් කොට සම්පූර්ණ වාක්‍යය ම තිත් ඉර මත නැවත ලියන්න. නිදොස් වේ නම් "නිවැරදියි" යන්න පමණක් ලියන්න.

(ලකුණු 05 යි)

11. දුටුගැමුණු රජතුමා ගුර සැලසුම්කරුවෙකු විය.

.....

.....

12. දුරදර්ශී පාලකයෝ දෙව්වරු මෙන් රට දීප්තිමත් කරති.

.....

.....

13. නීති විද්‍යාලයට නවක ශිෂ්‍යයන් උනන්දුවෙන් පැමිණෙති.

.....

.....

14. මහ වැස්ස නිසා මග දෙපස ගස් ගැලවී වැටෙයි.

.....

.....

15. නීති නිලධාරීන් වෘත්තීය ආචාරධර්ම ද ඉහළින් ම ආරක්ෂා කරති.

.....

.....

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද අතුරින් නොගැළපෙන අර්ථය සහිත පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති නිත් ඉර මත ලියන්න.

(ලකුණු 05 යි)

16. (1) වත	(2) වස්ත්‍රය	(3) මුහුණ	(4) විත	(.....)
17. (1) අහන	(2) දිව්‍ය	(3) ස්ත්‍රිය	(4) කත	(.....)
18. (1) කර්ණිකාව	(2) මුදුන	(3) මංජුසාව	(4) කැණිමඩල	(.....)
19. (1) කෙළ	(2) අන්තය	(3) බෙටය	(4) එළය	(.....)
20. (1) අංශය	(2) භාගය	(3) වංශය	(4) පංගුව	(.....)

- අංක 21 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ මුලින් දී ඇති තද කළු අකුරින් මුද්‍රිත යෙදුමට සමාන අර්ථය දෙන වාක්‍යාංශය හෝ පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති නිත් ඉර මත ලියන්න.

(ලකුණු 05 යි)

21. ඉබ්බන්ගෙන් පිහාටු ගන්නව වගේ
    (1) වටිනා දෙයක් ලබා ගැනීම (2) නිෂ්ඵල දෙයක් වෙනුවෙන් මහන්සි වීම
    (3) අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම (4) උත්සාහයේ වටිනාකම (.....)

22. ගින්නෙහි ලූ ලුණු මෙන්
    (1) දීප්තිමත් වීම (2) විමසිලිමත් විය යුතු බව
    (3) අධික කෝපයෙන් (4) කෙළිදෙළෙන් කාලය ගෙවීම (.....)

23. නිමිවව බතේ කැට පොඩි කරන්න ආව වගේ
    (1) අනාවශ්‍ය මොහොතේ පැමිණීම (2) මුල අමතක නොකිරීම
    (3) දුෂ්කර කාර්යයක් සඳහා සහාය වීම (4) ව්‍යාජ සහයෝගය (.....)

24. කුවාලෙට ලුණු දැමීම වගේ
    (1) කිසියම් වේදනාවක් ඇති කෙනෙකුට තවත් වේදනාවක් දීම
    (2) සුදුසු ප්‍රතිකර්මයක් කිරීම
    (3) කළ හැකි දෙයක් කිරීම
    (4) ලද දෙයින් සතුටු වීම (.....)

25. නයයි මුගටියයි වගේ
(1) හොඳින් ගැළපීම (2) දැඩි වෛරයෙන් ක්‍රියා කිරීම
(3) සමගියෙන් සිටිය යුතු බව (4) උත්සාහය අත් නොහැරීම (.....)

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ මුලින් දී ඇති තද කළු අකුරින් මුද්‍රිත පදයට සමානාර්ථයක් නොදෙන පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න. (ලකුණු 05 යි)

26. දද
(1) කොඩිය (2) රෝගයක් (3) බමුණා (4) මද (.....)

27. කෝෂය
(1) ආවරණය (2) අකාරාදිය (3) පෙට්ටිය (4) ධාන්‍යාගාරය (.....)

28. පෙළ
(1) ශ්‍රේණිය (2) ත්‍රිපිටකය (3) වහ (4) පේළිය (.....)

29. සෙල්
(1) සෙවෙල් (2) ගල් (3) පර්වත (4) ප්‍රපාත (.....)

30. අසි
(1) යෙහෙළිය (2) වාසි (3) ස්ත්‍රිය (4) කඩුව (.....)

- අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති එක් එක් වාක්‍යාංශයෙහි නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ අර්ථය දෙන වරණය තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න. (ලකුණු 05 යි)

31. ඇඟේ ගහනව
(1) හොඳින් පහර දීම (2) බෙහෙත් බැඳීම
(3) කෙසේ හෝ පොලඹවා ගැනීම (4) ආදරයෙන් ලබා දීම (.....)

32. ඉහ වහා යාම
(1) අදහස් සඵල වීම (2) අධික වීම
(3) නොසිතූ මොහොතක කැමති දෙයක් ලැබීම (4) යාන්තමින් පිරිමැඟීම (.....)

33. උඩ ගෙඩි දීම
(1) ගෙඩි කඩා දීම (2) ඔසවා දීම
(3) පාවා දීම (4) අනුබල දීම (.....)

34. බහුබුන දෙඩ වීම
(1) මං සලකුණු කීම (2) ආගිය තොරතුරු කීම
(3) අනවශ්‍ය විස්තර කීම (4) අනාවැකි කීම (.....)

35. පණ යන වැඩක්
(1) ප්‍රාණය නිරුද්ධ වීම (2) ඉතා දුෂ්කර ක්‍රියාවක්
(3) පහසුවෙන් කළ හැකි දෙයක් (4) ප්‍රියජනක කාර්යයක් (.....)

36. පහත සඳහන් පාඨය කියවා, අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. (ලකුණු 03× 05 = 15 යි)

සාහිත්‍යය කා හට කුමක් සඳහා ද යනුවෙන් නැගෙන ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම නිරර්ථක වැයමකි. සාහිත්‍යයේ අගය, මනුෂ්‍ය ජීවිතය සමග ඊට ඇති ඓන්ද්‍රිය සම්බන්ධතාව සාහිත්‍යය සේවනය කරන රසිකයෝ දනිති. අප සාහිත්‍ය කෘති කියවන්නේත්, ඒවා රස විඳින්නේත්, ප්‍රත්‍යවේක්ෂණයෙන් ගුණාගුණ විමසන්නේත්, විචාර විමර්ශන කරන්නේත් ඊට ඇති අනිමහත් ළැදියාව නිසා ය. සාහිත්‍යය අප හෘදයාභ්‍යන්තරය සොලවමින්, කළඹමින්, නළවමින්, පිරිමදිමින් කරන දයාර්ද්‍ර ආමන්ත්‍රණය නිසා ය. සාහිත්‍ය සේවනයෙන් අප අත්පත් කර ගන්නා වේදිත විෂයක සූක්ෂ්මාත්මතාව මෙන් ම දෘෂ්ටිමය විදග්ධතාව අන්‍යතර මාර්ගයකින් ලද නොහැකි ය. ඒ නිසා ම අපි සාහිත්‍යයට ලොල් වඩමු. ඒ කෙරෙහි ඇලුම් බැලුම් ඇති ව සිටිමු. සාහිත්‍යයෙන් අත් මිදී අවශේෂ මාර්ග ඔස්සේ ළඟා කර ගත හැකි භෞතික සම්පත් හඹා ලුහුබැඳ නොගොස් නෙදුක් කම්කටොලින් ගහණ සරවාසයෙහි සාහිත්‍යයට ලැගුම් සාදා එය සමග ම වෙසෙමු.

සාහිත්‍ය සේවනයෙන් අප සොයන්නේ මනුෂ්‍ය ජීවිතය ය. සාහිත්‍යය හා අතිනත ගෙන ගොස් දොර කවුළු හැර ප්‍රවිෂ්ට වන්නේ මනුෂ්‍ය ජීවිතයට ය. සාහිත්‍යයේ භාවාලෝක ධාරා විහිදුවා තිමිර පටල සිඳ බිඳ අප ගමන් කරන්නේ මනුෂ්‍ය ජීවිතයෙහි ගූඪ අභ්‍යන්තරයට ය. අප්‍රමාණ අත්දැකීම්වලට මුහුණපාමින් ජීවිතය ගෙවන අප හට ජීවිතය යනු කෙබඳු කවර දහමක්දැයි ප්‍රත්‍යක්ෂ කර ගැනීමට සාහිත්‍යය ප්‍රතිෂ්ඨාධාර වෙයි. පෘථග්ජන මනුෂ්‍යයා වනාහි නානාවිධ ආශා, අපේක්ෂා, ළැදිකම් රුචිකම්, ජීවන ප්‍රණිධාන පොදි බැඳගත්තෙකි. පෘථග්ජන මනුෂ්‍යයාට තනි ව ජීවත් විය නොහැකි ය. ඔහු අන්‍යයන්ගේ සමාගමය පතයි. ඒ නිසා ම උද්ගත වන මානව සම්බන්ධතාවල ස්වරූප ස්වභාව, ගැඹුර හා තීව්‍රතාව විවිධ ය. ජීවිතයට දෛවෝපගත ව උරුම ඉරණම හැඩහුරු ගන්වනු ලබන්නේ ඒ විවිධත්වය විසිනි.

සාහිත්‍යය ජීවිතය ගැඹුරින් වටහා ගැනීමට අවශ්‍ය ප්‍රතිවේදය ලබා දෙයි. අනපේක්ෂිත බාධක ගල්පරවල හැපෙමින්, ව්‍යසන කුණාටුවලට හසු ව බිඳෙමින්, ජීවන නෞකාව පදවාගෙන යන අතරතුර එළඹෙන අප්‍රමාණ විඩා පීඩා පිරිපත් වටහා ගන්නත් ඒවා සමග ගැටෙමින් ජීවත් වන්නත් එකී ප්‍රතිවේදය, ජීවිත පරිඥානය අපට අවශ්‍ය වෙයි. ප්‍රාර්ථනා සිඳ බිඳ වැටෙන කල, හේතු ප්‍රත්‍ය සොයා ගත නොහැකි ජීවන ව්‍යාකූලතා හටගැනෙන කල, මානව සම්බන්ධතාවල ලහු පරිවර්තනීය ස්වභාව විසින් හද කම්පා කෙරෙන කල ජීවිතය අත්නොහැර ජීවත් වීමට අනුප්‍රාණය එයින් සම්පාදනය වෙයි.

සාහිත්‍යය නිර්මාණය වන්නේ පෘථග්ජන මනුෂ්‍යයා අතරින් පැන නැගුණු විශේෂිත කෞශලයක් ඇති සාපේක්ෂ ව සුළුතර පිරිසක් අතිනි. ඔවිහු වනාහි සාහිත්‍ය නිර්මාණකරණයෙහි ලා උපයෝගී වන නිසර්ගසිද්ධ ප්‍රතිභාවත්, ඊට අවශ්‍ය ව්‍යුත්පත්ති ඥානය හා ශිල්පීය නෛපුණ්‍යයත් වර්ධනය කර ගත් ලේඛක ලේඛිකාවෝ ය. කවි කිවිඳියෝ ය. රාජ්‍ය සාහිත්‍ය සම්මාන පිරිනමා අප ගෞරව බහුමාන දක්වන්නේ ඔවුන්ට ය. ඒ, ඔවුන් සමස්ත මනුෂ්‍ය සමාජයට, සංස්කෘතියට ඉෂ්ට කරන විශිෂ්ට මෙහෙවර අගය කරමිනි.

(i). සාහිත්‍යය මගින් අපව ආමන්ත්‍රණය කෙරෙන්නේ කෙසේද?

.....

.....

.....

(ii). සාහිත්‍යය ප්‍රතිෂ්ඨාධාර වන්නේ කුමක් සඳහා ද?

.....

.....

.....

(iii). අනුප්‍රාණය අවශ්‍ය වන්නේ කවර අවස්ථාවන්හිදී ද?

.....

.....

.....

(iv). නිර්මාණකරණය සඳහා අත්‍යවශ්‍ය සාධක මොනවාද?

.....

.....

.....

(v). ප්‍රතිවේදය අවශ්‍ය වන්නේ කුමක් සඳහාද?

.....

.....

.....

37. පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාවෙන් තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. ඔබ ලියූ වචන සංඛ්‍යාව සාරාංශය අවසානයේ සඳහන් කරන්න.

(ලකුණු 20 යි)

ජොෂ්ඨ ද්විතීයික හා විද්‍යාලයීය තලයේ සිසුන්ට ඔවුන්ගේ කාලය මත බොහෝ වූ අවශ්‍යතා පැන නැගී ඇත. සාමාන්‍ය පාසල් දිනයක් තුළ මේ කණ්ඩායමේ සිසුවෙකු අපේක්ෂා කරන ක්‍රියාකාරකම්වලට ඇතුළත් වන්නේ, පාසල් ක්‍රියාකාරකම්, ගමනාගමනය (පාසලට සහ පාසලින්) පාසල් වේලාවෙන් පසුව විෂය බාහිර වැඩ, අතිරේක කියවීම්, ගෙදර වැඩ, පවුලේ අය සමඟ ගත කරන කාලය සහ නියමිත වේලාවක් නිදා ගැනීම යනාදිය යි. එහෙත් පුද්ගලික පන්ති මෙහි දී සලකා බලා නොමැත.

අද මංමාවත්වල පවතින දරුණු වාහන තදබදය හේතුවෙන් සිසුවකුට පාසලට ඒමට හා යාමට නැතහොත් ගමනාගමනය කිරීමට ගත වන කාලය බෙහෙවින් වෙනස් විය හැකි ය. පාසල් කාලයෙන් පසුව, තූර්ය වාදක කණ්ඩායම්, ක්‍රීඩා, වාද විවාද, සාහිත්‍ය, රඟපෑම් සහ නාට්‍ය, සංගීතය හා සංස්කෘතික ක්‍රියාකාරකම් ආදියෙහි නිරත වීම සිසුන්ගේ පුද්ගලික ජීවිත, යහපැවැත්ම හා අනාගත රැකියා අවස්ථා කෙරේ බොහෝ ප්‍රයෝජනවත් විය හැකි ය. ක්‍රියාකාරකම්වල නොකඩවා නිරත වීමේ දී ද කාලය වැය වේ. නවකරා වේවා, ප්‍රවෘත්ති වේවා, විද්‍යා ලිපියක් හෝ කාව්‍ය සමාලෝචනයක් වේවා, අතිරේක කියවීම, යෞවන සිසුන්ගේ සංජානනය හැඩගැස්වීමට උදව් වේ. බුද්ධිය ශක්තිමත් කෙරේ. එමෙන් ම සිතීම වඩාත් ගතික බවට පත් කරයි. එහෙයින්, දෛනික වශයෙන් ඉතා සුළු කාලයක් හෝ අතිරේක කියවීම සඳහා වෙන් කිරීමෙන් අයෙකුගේ ජීවිතයට ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි බව අපට නිසැකව ම කිව හැකි ය.

ලෝකයේ සියලු අධ්‍යාපනඥයින් සිසුන් සඳහා පාසලෙන් ලබා දෙන ගෙදර වැඩ, බොහෝ අතින් සිසුනට අත්‍යවශ්‍ය මෙන් ම වැදගත් වන බවට එකඟ නොවුව ද, බොහෝ අය පාසලෙන් ලබා දෙන ගෙදර වැඩ අත්‍යවශ්‍ය යයි විශ්වාස කරති. අරමුණක් ඇති ව කෙරෙන ගෙදර වැඩ පැවරුම්වලින් නව සංකල්ප පිළිබඳ අවබෝධය ඇති කළ හැකි අතර, සිසුන්ට විෂය ප්‍රමාණය ගැන වඩාත් ගැඹුරු අවබෝධයක් ලබා දිය හැකි අතර ස්වාධීන ව ප්‍රවීණත්වයක් ලැබිය හැකි කුසලතා ද දියුණු කර ගත හැකි වේ. ගෙදර වැඩ පැවරුම් නොකඩවා කිරීමෙන්, විභාගවල දී, සිසුන්ගේ කාර්ය ඵලය වැඩි දියුණු කර ගත හැකි වේ.

සමහර රටවල කරන ලද පර්යේෂණවලට අනුව, දරුවෝ මව්පියන් හා පවුලක් ලෙස ගුණාත්මක කාලයක් ගත කිරීම ද බොහෝ ප්‍රතිලාභ ගෙන දෙන්නකි. මව්පියන් හා දරුවන් අතර ස්ථිරසාර බැඳීමක් ඇති කිරීමට එය හේතු වන අතර ඒ මගින්, පවුලේ සාමාජිකයනට ඔවුන්ගේ සිතුවිලි හා හැඟීම් විවෘත ව ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබේ. ඒ නිසා ම දරුවෝ පාසලේ දී ඉහළ මට්ටමේ ශාස්ත්‍රීය කාර්ය ඵලයක් ද ලබා ගැනීමට සමත් වෙති.

පාසල් වියේ දරුවන්ට මනා සේ වැඩීමට සුබදායී නින්දක් ලැබීම ද හේතුවක් වන බව විශේෂඥයෝ පවසති. මේ වයසේ දරුවෙකුට අවම වශයෙන් එක රැයකට පැය 8.5 -9.0ක නින්දක් අවශ්‍ය ය.

38. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන, වචන 300 ක් පමණ වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

(ලකුණු 30 යි)

(i). නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම

(ii). රුසියා-යුක්රේන යුද්ධය හා භූ දේශපාලනය ශ්‍රී ලංකා ආර්ථිකයට කෙරෙන බලපෑම

(iii). මන්ද්‍රව්‍ය භාවිතය සහ තරුණ පරපුර

(iv). අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ මාර්ගගත ඉගෙනුම් ක්‍රමය